**කොලොන්න ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 22 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට කොලොන්න ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ ආදායම රු. 301,541 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වැටුප් ප්‍රතිපූර්ණ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | වෙනස හඳුනා ගතිමි. 2019 වසරේ අවසාන ගිණුම සකස් කරන විට මේවා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වැටුප් හා මන්ත්‍රී දීමනා රු. 41,440 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාළ ජංගම වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | වෙනස හඳුනා ගතිමි. 2019 වසරේ අවසාන ගිණුම සකස් කරන විට මේවා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාල ණයගිමි අයි වෙන්කිරීම රු. 200,483 ක් විය. | අයි වෙන්කිරීම් සඳහා අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුවේ. | වෙනස හඳුනා ගතිමි. 2019 වසරේ අවසාන ගිණුම සකස් කරන විට මේවා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල මුදල් ශේෂය රු. 187,934 ක් වැඩියෙන් දක්වා තිබුණි. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. | වසර ගණනාවක සිට මෙම වෙනස ඉදිරියට පැමිණ ඇති බැවින් ඒ පිළිබඳ සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 321,549 ක් අඩුවෙන් සමුච්චිත අරමුදලට බැරකර තිබුණි. | අඩුවෙන් බැර කර ඇති වටිනාකම සමුච්චිත අරමුදලට ගැලපීම් කළ යුතුවේ. | වෙනස හඳුනා ගතිමි. 2019 වසරේ අවසාන ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරමි. |

## 1.4 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 2002 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලයට අදාල රු. 389,458 ක් වූ ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල තැන්පතු ඉදිරියේදී නිදහස් කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 02 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන දහන පරීක්ෂාව සිදුකළ යුතුවේ. | එම වාහන වල ඉන්ධන දහන පරීක්ෂාව කඩිනමින් සිදු කිරීමට කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,140,777 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,678,718 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 952,000 | 983,154 | 1,027,574 | 214,672 | 854,000 | 1,087,363 | 1,069,580 | 8,614 |
| (ii) | කුලී | 4,404,814 | 4,435,691 | 4,255,369 | - | 4,568,080 | 3,649,074 | 3,644,855 | - |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,032,900 | 1,076,893 | 1,076,893 | - | 726,900 | 958,004 | 958,004 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,753,225 | 9,643,820 | 10,713,656 | 8,905,259 | 6,703,125 | 7,936,659 | 5,137,308 | 10,429,825 |

### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ තෝරාගත් ප්‍රදේශ කිහිපයක් දියුණු ගම් ප්‍රදේශ වශයෙන් නම් කිරීමට 2014 වර්ෂයේදී සභාව ඒකමතිකව තීරණය කර පළාත් පාලන කොමසාරිස්වරයාගේ අනුමැතියද ලබාගෙන තිබුණු නමුත් 2018 වර්ෂයේදී එම ගම් ප්‍රකාශයට පත්කිරීම සඳහා සභා අනුමැතිය ලබාදී නොතිබුණි. දියුණු ගම් ප්‍රදේශ හඳුනාගෙන තිබුණද, සභා අනුමැතිය නොලැබීම නිසා එම ප්‍රදේශ වලින් සභාවට අයකර ගත හැකිව තිබූ වරිපනම් බදු ආදායම අහිමි වීම් හා එමඟින් ඉටු කල හැකිව තිබූ බල ප්‍රදේශයේ සංවර්ධන හා සුභසාධන කටයුතුද නැවතී තිබුණි. | හඳුනාගෙන ඇති දියුණු ගම් ප්‍රදේශ ගැසට් කර වරිපනම් අයකර ගැනීමට සභාව කටයුතු කළ යුතුවේ. | මේ සඳහා සභාවේ ඒකඟතාවය පල නොවූ බැවින් ඉදිරි කටයුතු කිරීම ගැටළුවක් වී ඇත. නැවත සභාව දැනුවත් කර මෙම ප්‍රදේශ දියුණුගම් ප්‍රදේශ ලෙස නම් කිරීමට කටයුතු කරමි. |

### 2.2.3 වෙනත් ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජල ව්‍යාපෘති 04 න් අයවිය යුතු එකතුව රු. 40,151 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල හැකි ඉක්මනින් අය කර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | කොලොන්න සතිපොලෙන් රු. 195,875 ක බදු මුදලක් අයකර ගතයුතුව පැවතුණි. | අය කරගත නොහැකි හිඟ ආදායම් සම්බන්ධයෙන් නීතිමය පියවර ගත යුතුවේ. | කොලොන්න සතිපොළ හිඟ මුදල අය කර ගැනීම සඳහා නීතිමය කටයුතු කිරීමට තීරණය කර ඇත. |

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 858,747 ක් හා මුද්දර ගාස්තු රු. 64,600 ක් විය. | සභාව වෙත ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අප්‍රමාදව අයකර ගත යුතුවේ. | ලැබිය යුතු මුද්දර ගාස්තු හා උසාවි දඩ පළාත් සභාවෙන් ලබා ගැනීමට අවශ්‍යා කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

### (අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 වාර්ෂික අයවැය ලේඛනය මඟින් බල ප්‍රදේශයේ මාර්ග වැඩිදියුණු කිරීම සඳහා පළාත් සභා, විමධ්‍යගත හා සභා අරමුදල් වලින් රුපියල් මිලියන 9.6 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද, ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති කිසිවක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මඟින් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. | වාර්ෂික අයවැය ලේඛනයෙන් කරන ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘති වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ නිශ්චිතව හඳුනාගෙන තිබිය යුතුවේ. | 2018 වර්ෂයේ පළාත් සභා ප්‍රතිපාදන ලැබීම ඉතා දුර්වල තත්ත්වයක පැවති අතර, මධ්‍යම රජයෙන් අපේක්ෂිත ප්‍රතිපාදන ද කිසිවක් නොලැබිණි. ඒ හේතුව මත සංවර්ධන කටයුතු හා ජල ව්‍යාපෘති යනාදි විවිධ අංශ සඳහා ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ඉටු කර ගැනීමට නොහැකි විය. |

### (ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විධිමත් කසළ කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් සභාව අපොහොසත් වී තිබුණි. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | දිරන කසළ මඟින් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ මධ්‍යස්ථානයක් සකස් කර පවත්වාගෙන යාම සඳහා ඊට අදාළ ව්‍යාපෘති වාර්තා සහ සැලසුම් සකස් කරමින් පවතී. ඉදිරි මාසයේ දී ඒවා පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ඝන අපද්‍රව්‍ය මධ්‍යස්ථානය වෙත යොමු කිරීමට කටයුතු කරමි. එමෙන්ම ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයක් ඉදි කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කර සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. |

**(ඇ)** **පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) අනතුරුදායක කොස් ගස් 278 ක් කපා බිම හෙලීමට සභාව අනුමැතිය ලබා දී තිබුණු අතර, ඉන් කොස් ගස් 130 ක් සත්‍ය වශයෙන් අනතුරුදායකද යන්න තහවුරු කර ගෙන නොතිබුණි. | අනතුරුදායක බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් අදාල ගස් කපා ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබාදිය යුතුවේ. | ඉදිරියේදී දැඩි පරීක්ෂාවකින් හා පාලනයකින් යුතුව අනතුරුදායක ගස් ඉවත් කිරීමේ නියෝග ලබා දීමට කටයුතු කරමි. |
| (ii) සභාව විසින් අවසර පත්‍ර නිකුත් කර තිබූ කොස් ගස් 65 කින් 43 ක් කිසිදු අනතුරුදායක තත්ත්වයක් නොමැතිව දැව ලබා ගැනීමේ අරමුණින් කපා ඇති බව ස්ථානීය පරීක්ෂාවේදී තහවුරු විය. | අනතුරුදායක බව තහවුරු කර ගැනීමෙන් පසුව පමණක් අදාල ගස් කපා ඉවත් කිරීම සඳහා අනුමැතිය ලබාදිය යුතුවේ. | ඉදිරියේදී දැඩි පරීක්ෂාවකින් හා පාලනයකින් යුතුව අනතුරුදායක ගස් ඉවත් කිරීමේ නියෝග ලබා දීමට කටයුතු කරමි. |

**(ඈ)** **තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | තිරසර සංවර්ධන ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය දිගුකාලීන සැලසුම් සකස් කර ගැනීම සඳහා කටයුතු කරමි. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1998 වර්ෂයේදී සභා අරමුදලින් අත්තිකාරම් ලෙස ගෙවා තිබූ සභික දීමනා රු. 33,000 ක් හා 1994 මැයි සිට 1997 අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුල ගෙවා තිබූ තාවකාලික විශ්‍රාම වැටුප් රු. 50,310 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පියවා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | අදාල අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | 1994 දී කොලොන්න ප්‍රාදේශීය සභාවේ සේවය කළ සෞඛ්‍ය කම්කරුවකු වෙත ගෙවන ලද තාවකාලික විශ්‍රාම වැටුපකි. මේ සම්බන්ධව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ හා පළාත් පාලන කොමසාරිස්ගෙන් විමසා ඇති අතර, ලැබෙන උපදෙස් අනුව ඉදිරි කටයුතු සිදු කරමි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

### සේවක පුරප්පාඩු හා අතිරික්ත

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාවේ අනුමත හා තත්‍ය කාර්යය මණ්ඩල තොරතුරු අනුව තනතුරු 07 කට අදාලව පුරප්පාඩු 09 ක් පැවතුණු අතර, රියදුරු හා පුස්තකාල සහායක තනතුරු සඳහා සේවා ගිවිසුම් මත තිදෙනෙකු බඳවාගෙන තිබුණි. | තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, සේවා අවශ්‍යතා මත බඳවාගෙන ඇති තනතුරු විධිමත් කරගත යුතුවේ. | අදාල තනතුරු මේ වනවිටත් පුරප්පාඩුව පවතී. ආයතනයේ සේවා අවශ්‍යතා මත රියදුරු, පුස්තකාල සහායක යන තනතුරු සඳහා සේවා ගිවිසුම් මත තුන්දෙනෙකු බඳවාගෙන ඇති අතර, එක් සංවර්ධන නිලධාරී තනතුරක් අතිරික්තව පවතී. |

## 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 පවරා නොගත් වත්කම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සභාව සතු සුසාන භූමි 37 ක ඉඩම් අයිතිය නිරවුල් කරගෙන නොතිබුණි. | ඉඩම් වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සුසාන භූමි ලෙස හඳුනාගත් ඉඩම් 37 ක් ලේඛනගතව පවතී. එම ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු දැනට ආරම්භ කර ඇත. |
| (ආ) | විජේරිය කඩපොලෙහි බිම් කට්ටියක අයිතිය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අපොහොසත්ව තිබුණි. | ඉඩම් වල අයිතිය නිරවුල් කර ගත යුතුවේ. | අදාල ඉඩම් කොටස නීත්‍යානුකූලව පවරා දෙන මෙන් කොලොන්න ප්‍රාදේශීය ලේකම් වෙතින් ඉල්ලීම් කර ඇත. |

### 3.4.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 03 සිට වර්ෂ 10 දක්වා කාලයක් භාවිතයෙන් ඉවත් කර ඇති වටිනාකම රු. 3,904,050 ක් වූ වාහන 03 ක් හා යන්ත්‍රයක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා හා නඩත්තු කටයුතු ප්‍රමාදයකින් තොරව සිදුකළ යුතුවේ. | අදාල වාහන සහ වෛබ්‍රේට් යන්ත්‍රය අලුත්වැඩියා කළ යුතුව ඇත. ඒ සඳහා ඉදිරියේදී කටයුතු කරමි. |

### 3.4.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් 2014 මාර්තු සිට 2015 නොවැම්බර් දක්වා ධාවනයෙන් ඉවත් කර තිබූ ට්‍රැක්ටරයක් 2015 වර්ෂයේ රු. 52,570 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණද, රියදුරෙකු නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ධාවනයට යොදා ගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කළ යුතුවේ. | ට්‍රැක්ටරය ධාවනයේ යෙදවීමට කටයුතු කරන බව දන්වමි. |

### 3.5 ප්‍රසම්පාදනය

### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 966,562 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොමැති වුවත්, අදාළ භාණ්ඩ හා උපකරණ සහා තීරණ මත මිල ගණන් කැඳවා නීත්‍යානුකූලව ලබාගෙන ඇත. 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඇත. |

### 3.5.2 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඇස්තමේන්තුගත වියදම රු. 948,250 ක් වූ කුකුළු ඇල වෙල්යායේ වේල්ල සංවර්ධනය කිරීම කර්මාන්තයේ වැඩ විෂයයන් 05 ක් යටතේ ඉටු නොකල වැඩ වෙනුවෙන් එකතුව රු. 48,729 ක් ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගත යුතුවේ. | වැඩිපුර ගෙවා ඇති රු. 48,729 ක මුදල රැඳවුම් මුදලින් අඩුකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | වියදම රු. 830,419 ක් වූ දොඹගහවේල්ල සංවර්ධනය කිරීම 2018 සැප්තැම්බර් 21 දින වනවිට අවසන් කර තිබුණද, ඇල මාර්ගය වේල්ල මට්ටමට වඩා ඉහලින් ඉදිකර තිබීම හේතුවෙන් වැඩ අවසන් කර ඇති වේල්ලෙන් ප්‍රයෝජනය ගත නොහැකිව තිබුණි. එමෙන්ම මෙම කර්මාන්තය | කර්මාන්තයේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ඉතිරි වැඩ අවසන් කිරීමටත් වැඩිපුර ගෙවීම් ආපසු අයකර ගැනීමටත් කටයුතු කළ යුතුවේ. | ලැබී ඇති ප්‍රතිපාදන මත වැඩ අවසන් කර ඇති අතර, ඉතිරි ප්‍රතිපාදන ඉල්ලා ඇතත්, මේ දක්වා අනුමත වී නැත. එමෙන්ම කර්මාන්තය සඳහා සත්‍ය වශයෙන්ම වැඩිපුර ගෙවා ඇත්තේ රු. 6,912 ක් බව පෙන්වා දෙන අතර එම මුදල කොන්ත්‍රාත්කරුගේ |

| | | |
|---|---|---|
| | සඳහා කම්බි කිලෝ ග්‍රෑම් 182 ක් වෙනුවෙන් රු. 39,020 ක් වැඩිපුර ගෙවා තිබුණි. | රැඳවුම් මුදලින් අය කර ගැනීමට කටයුතු කරමි. |

**4.** **ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------------

**අයවැය පාලනය**

------------------

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සහාව අපොහොසත් වී තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 19 කට අදාලව එකතුව රු. 10,223,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම්සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත්, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කළද එම වැය විෂයයන් යටතේ අපේක්ෂා කරන ලද කටයුතු ඉටු කළ නොහැකි විය. එබැවින් ඉදිරි වර්ෂයේදී අයවැය සකස් කිරීමේ කටයුතු සිදු කිරීමේදී මේ පිළිබඳ අවධානය යොමු කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 28 කට අදාලව එකතුව රු. 27,524,964 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 40 සිට සියයට 98 දක්වා පරාසයක ඉතිරිවීම් තිබුණි. | සැලසුම්සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත්, එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | කාර්යාලයේ විවිධ වියදම් සම්බන්ධයෙන් සලකා බලා අයවැය මඟින් ප්‍රතිපාදන වෙන් කර ඇති අතර, ඉටු කළ කාර්යයන් හා වැඩ වෙනුවෙන් මුදල් ගෙවීම සිදුකර ඇත. ඒ අනුව වෙන් කරන ලද වැය විෂයයන්හි ඉතුරු වීම් පෙන්වන අතර ඉදිරි වර්ෂයට අදාළව අයවැය සකස් කිරීමේදී මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කරමි. |